# ජනප්‍රවාද වලින් හෙළිවන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන

දිල්රුක්ෂි ඩී.එම්.ටී.[1]

ශ්‍රී ලංකා ඉතිහාසයේ සිව්වන රාජධානිය බිහිවන්නේ කුරුණෑගලයි. කුරුණෑගල දිස්ත්‍රික්කය ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් පුළුල් වැදගත්කමකින් යුක්ත භූ ප්‍රදේශයකි. කුරුණෑගල හා සබැඳි බොහෝ ජනප්‍රවාද පවතින අතර එම ජනප්‍රවාද වලින් හෙළිවන මෙම භූමි ප්‍රදේශයට අයත් ඓතිහාසික ස්ථාන කිහිපයක් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර ඒ තුළින් එම ස්ථාන සංරක්ෂණයට හා නිසි කළමනාකරණයකට ලක් කිරීමට අදාළ බලධාරීන්ව යොමු කිරීම උප අරමුණක් වේ. පර්යේෂණ ක්‍රමවේද ලෙස ප්‍රදේශයේ ජනතාව සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා සාහිත්‍ය අධ්‍යයනය යොදා ගන්නා ලදී. විජය කුවේණිය හා සබැඳි ජනප්‍රවාදයක් වේ. විජය රජු විසින් නෙරපා හරින කුවේණිය ඉතාමත් දුකින් හා කෝපයෙන් ශාපයක් කළ බවත් ඒ ශාපය සිදු කළ ස්ථානයේ සිටි සතුන් කිහිපදෙනෙක් ගල් පර්වත හැඩයට පරිවර්තන වූ බව ජනප්‍රවාදයේ එයි. මෙම ජනප්‍රවාදයෙන් හෙළිවන ඓතිහාසික ස්ථාන කිහිපයක්ම වේ. එක් ස්ථානයක් වන්නේ ඉබ්බාගල රජමහා විහාරයයි. මෙය පුරාණ ලෙන් විහාරයක් මෙන්ම උඩරට සම්ප්‍රදායට අයත් ප්‍රතිමා සහ බිතිසිතුවම් ද සහිත ස්ථානයකි. එම ජනප්‍රවාදයෙන් හෙළිවන තවත් ස්ථානයක් ලෙස ආඳාගල පෙන්වාදිය හැකිය. මෙය පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත්කමක් සහිත ස්ථානයකි. ඉතිහාසගත බොහෝ තොරතුරු හෙළිවන ආඳාගල තඹ සන්නස මෙහි වේ. ඉහත ජනප්‍රවාදයෙන් හෙළිවන තවත් ස්ථානයක් වන්නේ ඇතාගලයි. ඇතාගල ආශ්‍රය කරගෙන ඇත්කඳ විහාරය නිර්මාණය වී ඇත. මෙහි කුරුණෑගල යුගයට අයත් යැයි සැලකෙන මුරගල්, සිරිපතුලක්, විවිධ සිතුවම් ආදී නටබුන් රැසක් වේ. කුරුණෑගල ප්‍රදේශයට අරක් ගෙන සිටින එම ප්‍රදේශය ආරක්ෂා කරන දෙවියන් වන්නේ ගලේ බංඩාර දෙවියන් බව ජනතාව විශ්වාස කරයි. ගලේ බංඩාර දෙවියන් නමින් දේවත්වයට පත් වූයේ කුරුණෑගල රජ කළ වත්හිමි කුමරු බව ජනප්‍රවාදයේ එයි. ඒ අනුව බිහි වූ ගලේ බංඩාර දේවාලයක් ඇත. කුවේණිය තමන් සමඟ ආරෝවකට පැමිණි අයෙකුට අංගමං පිම්බ අතර එම ස්ථානය අංගංගල රජමහා විහාරය පිහිටා ඇති බව ජනප්‍රවාදයේ එයි. මෙම විහාරයේ තිබී වසර සියයක් පමණ පැරණි දාන ශාලාවක නටබුන් ද ගල්ලෙනක්, ඉපැරණි පිළිම ගෙයක්, සිරිපතුලක්, ඉපැරණි සිතුවම් යන වැදගත් පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත අංග හමු වී ඇත. තවද රාජ භටයන් මුරලූ පර්වතය "මරළුවාව" වූ බව ජනප්‍රවාදයේ එයි. එම ස්ථානය ද ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථානයකි. කුරුණෑගල නගරය සම්බන්ධව ඇති මෙම ජනප්‍රවාද වලින් හෙළිවන දීර්ඝ ඉතිහාසයක් හා ඓතිහාසික වටිනාකමක් ඇති සඳහන් කළ නොකළ ස්ථාන රාශියක් ඇති අතර එම ස්ථාන නිසි කළමනාකරණයකට යොමු වුවහොත් එය සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට හොඳ තෝතැන්නක් වනු නොඅනුමානය.

**ප්‍රමුඛ පද :** කුරුණෑගල, ජනප්‍රවාද, පුරාවිද්‍යාත්මක, රජමහා විහාරය, ස්ථානයක්

[1] thakshila.dilrukshi716@gmail.com